# ඔන්ලයින් පනත පිළිබඳ තාක්ෂණික ඇසින්



**බරපතළ ගනයේ ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධ, සයිබර් අපරාධ හා ත්‍රස්තවාදය වැළැක්වීම හා මැඩලීම සඳහා පිහිටුවා ඇති ප්‍රධාන සංවිධානයක් වන නෙදර්ලන්තයේ හේග් නුවර මූලස්ථානය කොටගත් 'EUROPOL' විසින් 2018 වර්ෂයේදී සයිබර් අවකාශය මතම රඳා පවතින අපරාධ (cyber dependent crimes) සහ සයිබර් අවකාශ උපයෝගී කරගෙන සිදුකරන අපරාධ (cyber-enabled crimes) අතර වෙනස පැහැදිලිව දක්වා ඇත. එමගින් අර්ථ දක්වා ඇති පරිදි යම්කිසි අපරාධයක් සිදුකළ හැක්කේ පරිගණක, පරිගණක ජාල හෝ තොරතුරු තාක්ෂණය පදනම් කරගෙනම පමණක් නම් එය සයිබර් අවකාශය මත රඳා පවතින අපරාධයක් ලෙසත්, සම්ප්‍රදායිකව සිදුකරන අපරාධ අන්තර්ජාලය හා ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් සිදුකිරීම සයිබර් උපයෝගිතා අපරාධ ලෙස අර්ථ දක්වා ඇත.**

සයිබර් අවකාශ උපයෝගී කරගෙන සිදුකරන අපරාධ ලෙස පරිගණක ජාල තුළට අනවසරයෙන් ඇතුළු වීම, පරිගණක වෛරස වැනි අනිෂ්ට මෘදුකාංග මගින් පරිගණකයක ක්‍රියාවලියට හානි කිරීම, පරිගණක මගින් ලබාදෙන සේවාවක් බිඳ වැට්ටවීම (Denial of Service) ආදිය හැඳින්විය හැක.

සයිබර් උපයෝගිතා අපරාධ ලෙස ළමා ලිංගික සූරාකෑම, සයිබර් අවකාශය හරහා සිදුවන ළමා අපචාර, වංචා (frauds), වංචාසහගත පණිවිඩ (scams) බ්ලැක්මේල් කිරීම, කප්පම් ගැනීම ආදිය හඳුන්වා ඇත.

සයිබර් මත යැපෙන අපරාධ බොහොමයකට අවශ්‍යවන නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා දැනටමත් 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතේ ප්‍රතිපාදන ලබා දී ඇත.

අපහාස කිරීම, හිරිහැර කිරීම්, වැරදි තොරතුරු, පුද්ගලාරෝපණය වැනි අන්තර්ගතයට සම්බන්ධ ගැටලු මාර්ගගත ක්‍රමවලින් පමණක් නොව වෙනත් සාම්ප්‍රදායික ක්‍රම (ඉලෙක්ට්‍රොනික හෝ මුද්‍රිත මාධ්‍ය) භාවිතා කිරීම හරහාද සිදු වේ. එබැවින් එවැනි දෑ සයිබර් උපයෝගිතා අපරාධ යටතට පත් වේ. මෙවැනි සාම්ප්‍රදායික අපරාධ සඳහා ප්‍රමාණවත් නීති ශ්‍රී ලංකාව තුළ තිබේ. එසේ නොවන්නේ නම් ඊට අදාළ නීති සංශෝධන කළ යුතුය. අන්තර්ජාල මාධ්‍ය සඳහා පමණක් මෙවැනි අපරාධ සඳහා වෙනම නීති සම්පාදනය කිරීම උචිත නොවන අතර එසේ සිදුකිරීම සැකයට තුඩු දෙන්නකි.

## සමාජ මාධ්‍ය පනත?

එබැවින් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත තාවය යනුවෙන් පනතක් ගෙන ඒමම ගැටලුකාරීය. තවද මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාව ලෙස මෙම පනත නම් කිරීමද ගැටලුකාරී වන්නේ එහි අර්ථය ඉතා පුළුල් වන බැවිනි. එසේ නම යොදා ගන්නේ නම් එහි මා ඉහතින් සඳහන් කරන ලද සයිබර් අවකාශය මතම රඳා පවතින අපරාධ පිළිබඳවද එහි ප්‍රතිපාදන ලබා දිය යුතුය. එය එසේ නොවේ. මෙහි සඳහන් වන්නේ සයිබර් උපයෝගිතා අපරාධ සම්බන්ධ ප්‍රතිපාදන පමණි. මේවා බොහෝ විට අන්තර්ගතය සම්බන්ධ ගැටලුය. මෙහිදී සමාජ මාධ්‍ය නියාමනයට ප්‍රමුඛතාව දී ඇති බැවින් පනතේ නම සමාජ මාධ්‍ය නියාමන පනත ලෙස වෙනස් කිරීම සුදුසු බව මගේ අදහසයි.

මෙම පනත කෙටුම්පත් කිරීමේදී තොරතුරු තාක්ෂණික විශේෂඥයන්ගේ දායකත්වය ලබා නොගෙන නීති සම්පාදකයින්ගේ පමණක් දායකත්වය ලබගෙන ඇති බවට හැඟී යන්නේ මෙහි ඇති බොහෝ ප්‍රතිපාදන ප්‍රායෝගිකව සිදු කළ නොහැකි බැවිනි. උදාහරණයක් ලෙස ගෝලීය අන්තර්ජාල අතරමැදියන් හරහා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කළ නොහැක්කේ ශ්‍රී ලංකා වෙළෙඳපොළ ඔවුන්ට නොසැලකිය හැකි තරම් කුඩා බැවින් ඒවා බලාත්මක කිරීමට තරම් කේවල් කිරීමේ බලයක් අපට නොමැති බැවිනි. මෙය තොරතුරු තාක්ෂණික විශේෂඥයින් විසින් පෙන්වා දිය



**ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ හිටපු ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ඉංජිනේරු,**
**රෝහණ පල්ලියගුරු**
**විසිනි.**

යුත්තකි. නමුත්, මෙහි බලපෑම නිසා ඔවුන්ගේ සේවාවන් මෙරටින් ඉවත් කරගතහොත් එය මෙරට ආර්ථිකයට මෙන්ම සමාජ සංහිඳියාවට ද දැඩි ලෙස බලපානු ඇත.

## අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස

මෙම මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට විශාල බලපෑමක් ඇති කරනු ඇත. ප්‍රකාශයක නිරවද්‍යතාව තීරණය කර එය අසත්‍ය/සත්‍ය ප්‍රකාශයක් දැයි ප්‍රකාශ කිරීමේ බලය මිලියන 21 ක ජනගහනයෙන් දේශපාලන වශයෙන් ස්වාධීන යයි සිතිය නොහැකි පස් දෙනෙකුට (05) ලබා දී ඇති අතර මෙම පනත ක්‍රියාත්මක කිරීම සඳහා පත් කරනු ලබන කොමිසමේ සාමාජිකයන් 5 දෙනා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියෙන් ජනාධිපතිවරයා විසින් පත් කිරීම මෙහි ස්වාධීනතාවය මෙන්ම අපක්ෂපාතීත්වයටද අහිතකර ලෙස බලපානු ඇත. එනම් මෙහිදී සාමාජිකයින් නම් කිරීම සිදුවන්නේ ජනාධිපතිවරයා විසින් බැවින් ඔහුට අභිමත පක්ෂපාති පුද්ගලයන් නම් කිරීමේ හැකියාවක් පැවතීමයි. ඔවුන් ඕනෑම අවස්ථාවක ඉවත් කිරීමේ බලයද ජනාධිපතිවරයා වෙත ලබාදී ඇත. ඒ සඳහා දී ඇති ප්‍රතිපාදන හරහාම අවශ්‍ය හේතු ඉදිරිපත් කළ හැකි අතර සාමාජිකයාට කරුණු දැක්වීමට පමණක් අවස්ථාවක් ලබාදී ඇත. අභියාචනා ක්‍රියාවලියක්වත් සිදු නොවේ.

## තාක්ෂණික හැදෑරීම මදි

පනතේ සාමාජිකයන් ලෙස පත් කිරීමට නුසුදුසුකමක් ලෙස මූල්‍යමය හෝ වෙනත් යම් සබඳතාවක් තිබීම දක්වා ඇතත් දේශපාලනික වශයෙන්ද ස්වාධීන වීම දක්වා නැත. එමෙන්ම මෙවැනි සාමාජිකයෙකුට අන්තර්ජාල සේවා සපයන්නන්, සමාජ ජාල සේවා සපයන්නන්, අන්තර්ජාල අතරමැදියන් සමඟ සබඳතාවල ගැටීමක්ද තිබිය නොහැකි වීම අත්‍යවශ්‍ය වුවත් ඒ පිළිබඳව මෙහි දක්වා නොමැත.

කොමිෂන් සභාවට ඉතා ප්‍රබල බලතල හා කර්තව්‍යයන් පවරා ඇතත් ඒවා ඉටුකරලීමේදී ප්‍රායෝගික බාධක රාශියක් පවතී. මේ පිළිබඳව ප්‍රමාණවත් තාක්ෂණික හැදෑරීමක් හෝ උපදේශනයක් ලබාගැනීමෙන් තොරව ප්‍රතිපාදන යොදා ඇති බව පෙනේ. මෙම ප්‍රායෝගික ගැටලු මතුවන්නේ ක්‍රියාත්මක වීමට යාමත් සමඟය. මෙහි ප්‍රතිඵල ඔවුන් ඉදිරියේදී අත්දකිනු ඇත.

අන්තර්ජාල සේවා සපයන්නන් හා අන්තර්ජාල අතරමැදියන්ට නිකුත් කරන විධාන ඔවුන් කොතරම් දුරට පිළිගන්නේද යන්න කෙළින්ම රඳා පවතින්නේ රටක් වශයෙන් අපට ඇති කේවල් කිරීමේ බලය සමගයි. ඉන්දියාවට, ජපානයට හෝ චීනයට ඇති කේවල් කිරීමේ බලය අපට නැත්තේ මිලිනය 21 පමණ වන අපේ ජනගහනය එවැනි පනාක යෝධයින්ට බලපෑම් කළ හැකි වෙළෙඳපොළක් නොවන බැවිනි. එමෙන්ම මෙවැනි සේවා සපයන ගෝලීය සමාගම් හඳුන්වා දී ඇති ප්‍රජා සම්මතයන් දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ හරහා ඔවුන් විසින්ද යම් මට්ටමක නියාමනයක් ඔවුන්ගේ ජාලය තුළ ක්‍රියාත්මක කරයි. ඔවුන් විසින් හඳුන්වා දී ඇති මෙම ප්‍රජා සම්මතයන්ගෙන් ඔබ්බට ගොස් කුඩා රටක පවතින කොමිසමක් විසින් ලබා දෙන නියෝග ක්‍රියාත්මක කිරීමට ඔවුන් එකඟ වේ යයි සිතිය නොහැක.

අන්තර්ජාල සේවා සපයන්නන් විසින් සිදුකරන්නේ අන්තර ජාල පහසුකම ලබාදීම වන අතර එහි අන්තර්ගතය හෝ පරිශීලකයන් කුමක් සඳහා එය භාවිත කරන්නේ ද යන්න ඔවුන්ට අදාළ නොවේ. එබැවින් තහනම් යැයි කොමිසම නිගමනය කරනු ලබන අන්තර්ගතයන් සම්බන්ධයෙන් එහි බලපෑමට ලක්ව ඇති තැනැත්තන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා අවස්ථාවක් ලබාදෙන ලෙස ඔවුන් වෙත විධාන නිකුත්කිරීම විහිළු සහගතය.

## තහනම් ප්‍රකාශන

තහනම් ප්‍රකාශ සන්නිවේදනය කරන තැනැත්තන්ට එකී ප්‍රකාශ සන්නිවේදනය කිරීම නතර කරන ලෙස දැන්වීමට පෙර ඔවුන් නිශ්චිතව හඳුනා ගත යුතුය. එය සිදු කරන්නේ කවුද? එසේම යම් තැනැත්තෙක් නිශ්චිතව හඳුනාගැනීම සඳහා අදාළ සමාජ මාධ්‍ය සේවා සපයන ආයතනයෙන් පෞද්ගලිකත්වයට අදාළ දත්ත ලබාගැනීමට සිදුවේ. සෑම ගෝලීය සේවා සපයන ආයතනයක්ම පරිශීලකයන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂාකිරීමට (Privacy Policiesහරහා) බැඳී සිටින බැවින් ඔවුන්ගේ පෞද්ගලිකත්ව ප්‍රතිපත්ති අභිභවා කොමිසම වෙත එම තොරතුරු ලබා දීම සැක සහිතය.

තහනම් යයි කොමිසම නිගමනය කරනු ලබන ප්‍රකාශයක් ඒ මාර්ගගත ස්ථානයෙන් ඉවත් කිරීමට හෝ ලංකාව තුළ සිටින පරිශීලකයන්ට අවහිර කිරීමට අන්තර්ජාල අතරමැදියන්ට දැන්වීම් නිකුත් කළ හැකි වුවත් මා ඉහතින් සඳහන් කළ පරිදි ඔවුන් ඒවා ඉවත් කිරීමක් හෝ අවහිර කිරීමක් සිදු කරන්නේ ඔවුන්ගේ ප්‍රතිපත්ති වලට එම අන්තර්ගතය පටහැනි නම් පමණි. මෙවැනි අවස්ථාවකදී කොමිසමට කළ හැක්කේ ලංකාවේ සිටින අන්තර්ජාල සේවා සපයන්නන් හරහා අදාළ ජාලයම අවහිර කිරීම පමණි.

ඉතිරිය 12 වැනි පිටුවට...

# ඔන්ලයින් පනත පිළිබඳ...

4 වැනි පිටුවෙන්...

මෙය සියලුම පරිශීලකයින්ට කරන අසාධාරණයක් වන අතර මෙම සේවා සපයන්නන් අප රටට සේවා සැපයීමෙන්ද ඉවත් විය හැක. අන්තර්ජාල අතරමැදියන් සතුව කෘතිම බුද්ධිය වැනි නවීන තාක්ෂණය යොදා ගෙන තැනූ සංකීර්ණ ක්‍රියාවලින් (AI algorithm) හරහා යම් අන්තර්ගතයක් මගින් ඔවුන්ගේ ප්‍රජා සම්මතයන් (community standards) බිඳ වැටේදැයි ස්වයන්ක්‍රීයව පරීක්ෂා කිරීමේ හැකියාවක් පවතිද්දී තහනම් ප්‍රකාශ ඉවත් කිරීම සඳහා කොමිසම මගින් ඔවුන් වෙත නිර්දේශ ලබා දීම ඔවුන් කොතරම් දුරට පිළිගනීද? මෙය ප්‍රායෝගිකව සිතිය යුත්තකි.

යම් ප්‍රකාශයක අසත්‍යතාව සම්බන්ධයෙන් මහජනයාට අවබෝධයක් ලබාදීම සඳහා වන තොරතුරු ඇතුළත් මාර්ගගත පිවිසුමක් පවත්වාගෙන යාමට යෝජනා කර ඇති අතර, මෙය විහිලුවට කාරණයක් වන්නේ මෙයින් ලබාදෙන තොරතුරු වලට වඩා වැඩි මූලාශ්‍ර ප්‍රමාණයකින් මහජනයාට තොරතුරු ලබාගෙන ස්වයං නිගමනවලට පැමිණිය හැකි බැවිනි.

කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි විමර්ශන සිදු කිරීමට ඒ සඳහා තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් විශේෂඥ දැනුමැති කණ්ඩායමක් අවශ්‍යය. මෙය සිදුකරන්නේ කවුද?කොමිෂන් සභාව සතුව ස්ථිර අභ්‍යන්තර විමර්ශන කණ්ඩායමක් සිටීද?

## ගෝලීය අන්තර්ජාල සේවා සපයන්නන්ගේ සහාය

ගෝලීය අන්තර්ජාල සේවා සපයන අතරමැදි ආයතන රීති මගින් පාලනය කිරීම හෝ ලංකාව තුළ ලියාපදිංචි වීම සඳහා රීති සැකසීම ප්‍රයෝගික නොවේ. අපට එසේ කිරීමට අවශ්‍ය තරම් වෙළෙඳ පොළක් හෝ කේවල් කිරීමේ බලයක් නොමැති බංකොලොත් රටකි. එබැවින් මෙම ප්‍රතිපාදනය ප්‍රායෝගික නොවේ.

යම් අසත්‍ය ප්‍රකාශයක් සිදු කරන ලද තැනැත්තෙක් නිශ්චිතව හඳුනා ගැනීම සඳහා අන්තර්ජාල සේවා අතරමැදියන්ගෙන් පෞද්ගලිකත්වයට අදළ තොරතුරු ලබාගැනීමට සිදුවේ. මෙය කොතරම් දුරට ප්‍රායෝගිකද? මා ඉහතින්ද සඳහන් කළ පරිදි ඔවුන් කොමිසම ඉල්ලා සිටින තොරතුරු ලබා දෙයිද? එසේ ලබා දුන්නද එම පුද්ගලයා ලංකාවෙන් පිටත සිටින තැනැත්තෙක් නම් නීතිය ක්‍රියාත්මක කරන්නේ කෙසේද? පිටරට සිටින අන්තර්ජාල සේවා සපයන්නන් විමර්ශනයන්ට අවශ්‍ය දත්ත කොමිසම වෙත ලබා දෙයිද?

තවද, එක් මොහොතක සත්‍ය වන කාරණයක් තවත් මොහොතක අසත්‍ය විය හැක. ප්‍රකෝප කිරීමක් හෝ කැරලි ගැසීමක් සිදුවුයේ සත්‍ය ප්‍රකාශයක් පදනම් කරගෙන වුවත් කැරලි ඇතිවීම නිසාම කොමිසම මගින් එය අසත්‍ය ප්‍රකාශයක් ලෙස පසුව අර්ථ දැක්වීම හැකියාවක්ද පවතී.

සත්‍ය ප්‍රකාශයක් මගින් ආගමික රැස්වීමකට බාධා කිරීම නිසාම එම සිද්ධිය සිදු නොවීම නිසා පසුව එය අසත්‍ය ප්‍රකාශයක් බවට පත්විය හැක. උදහරණයක් ලෙස, පාස්කු බෝම්බය පිපිරීමට පෙර එය ප්‍රචාරය කොට ආගමික රැස්වීම්වලට බාධා කිරීම නිසාම බෝම්බ පිපිරීම සිදු නොවිය හැක. නමුත් පසුව බෝම්බ පිපිරීම සිදු නොවූ නිසා ඉහත ප්‍රකාශය සිදු කරන ලද්දේ උක්ත ආගමික රැස්වීමට බාධා කිරීමට යයි පවසා අසත්‍ය ප්‍රකාශයක් ලෙස අර්ථ දැක්විය හැක.

ආගමික හැඟීම් නිග්‍රහයට පාත්‍ර කිරීම ඉතා සංවේදී කාරණයක් වන අතර එය අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය හා එහි සීමාව මත තදින් රඳා පවතී. ආගමක් සම්බන්ධයෙන් යමෙකුගේ විශ්වාසයන් අන් අයෙකුගේ මතයට පටහැනි වියහැකි අතර එය ප්‍රකාශ කිරීමේ අයිතිය කෙසේ විය යුතුද? උදහණයක් ලෙස යමෙකු දෙවියන් කියා කෙනෙක් නැති බව ප්‍රකාශ කිරීම යම් ආගමකට නිග්‍රහ කිරීමක් හා අසත්‍ය ප්‍රකාශයක් වන්නේද ?

## රැවටීම් සිදුවන්නේ ඔන්ලයින් හරහා පමණද?

රැවටීම් සිදුවන්නේ මාර්ගගත ක්‍රමවලින් පමණක් නොවේ. ඒ සඳහා වෙනත් සම්ප්‍රදායික ක්‍රමවේද ද බහුලව භාවිතා වේ. එබැවින් මාර්ගගත ක්‍රමවලට පමණක් සීමා වන නීති ප්‍රතිපාදනයන්ට වඩා සියල්ලටම පොදු වන නීතියක් හඳුන්වා දීම හෝ තිබෙන නීතියක් යාවත්කාලීන කිරීම වඩා උචිතය.

අනෙකෙකු ලෙස පෙනී සිටීම සිදුවන්නේද මාර්ගගත ක්‍රමවලින් පමණක් නොවේ. ව්‍යාජ ලියකියවිලි යොදගෙනද මෙම වංචාව සිදු කළ හැක. එබැවින් මාර්ගගත ක්‍රමද ආවරණය වන පරිදි තිබෙන නීති යාවත්කාලීන කිරීම සිදුකළ යුතුව තිබිණි. ළමා අපයෝජන සම්බන්ධයෙන් මෙම පනතේ දක්වා ඇති ප්‍රතිපාදන සිදුකළ යුතුව තිබුණේ ඊට අදළ ළමා ආරක්ෂණ පනත වැනි දැනට පවතින වෙනත් පනත් යාවත්කාලීන කිරීමෙන් මිස ඒවා අන්තර්ජාලය යන මාධ්‍යය නිසාම වන වරදක් ලෙස හුවා දැක්වීමෙන් නොවේ. මාර්ගගත ක්‍රම යනු ළමා අපචාර සිදුවන එක් මාධ්‍යයක් පමණි.

ව්‍යාජ මාර්ගගත ගිණුමක් හෝ බොට් යොදා ගනිමින් යම් ප්‍රකාශයක් සිදුකළ තැනැත්තන්ගේ තොරතුරු හෙළිදරවු කරන ලෙස ආඥාවක් ලබා ගත හැකි වුවත් මා විසින් කිහිප වරක් ඉහතින් සඳහන් කළ පරිදි අන්තර්ජාල අතරමැදි සේවා සපයන්නාගේ පවතින පෞද්ගලිකත්ව ප්‍රතිපත්තීන් නිසා ඔවුන් මෙයට කොපමණ දුරට ප්‍රතිචාර දක්වාවිදැයි සැක සහිතය.

මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීතියක් තිබුණේනම් මෙය පහසු වන අතර සයිබර් ආරක්ෂණ සම්මුතීන් හරහා මෙය සිදුකිරීමට බලාපොරොතු වන්නේ නම් එය ප්‍රායෝගික නොවන බවද අපි අත්දැකීමෙන් දන්නෙමු.

මෙම පනත මගින් තුන්වන පාර්ශවයක් විසින් යම් දෙයක් උඩුගත කරනු ලැබ ඇති හෝ යම් දෙයකට මැදිහත් වනු ලැබ ඇති අවස්ථාවක අන්තර්ජාල සේවා සපයන්නන් වගකීමෙන් නිදහස් කොට ඇත. මෙසේ කීම අවශ්‍ය නොවන්නේ එය ඔවුන්ගේ වගකීමක් නොවන බැවිනි. මා කලින්ද සඳහන් කළ පරිදි අන්තර්ජාල සේවා සපයන්නන්ගේ කාර්ය භාරය මෙම නීති සම්පාදකයන් විසින් මනාව හඳුනා ගත්තේ නම් මෙවැනි ප්‍රතිපාදනයක් නොයොදනු ඇත.

ගෝලීය අන්තර්ජාල අතරමැදි සේවා සපයන්නන්ගේ පවතින ප්‍රජා සම්මතයන්ට පටහැනි වුවහොත් මිස, අන්තර්ගතයන් සම්බන්ධයෙන් ඔවුන් විසින් ක්‍රියාමාර්ග නොගනු ඇත. ඔවුන් අන්තර්ගතය සම්බන්ධ ගැටලු නිරාකරණය සඳහා අපේ අධිකරණයෙහි පෙනී සිටිනු ඇතැයිද සිතිය නොහැක. පනතේ 29 වගන්තියේ දක්වා ඇති පරිදි ලංකාව තුළදී ගෙවීමක් සිදුකරන අන්තර්ගතයන් ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථාන වල සන්නිවේදනය නොකළ යුතු බවට පනවා ඇති විවිධ කොන්දේසි ගෝලීය අන්තර්ජාල අතරමැදියන් එකඟ වේ දැයි නැවත සිතා බැලිය යුතු බව මගේ හැඟීමයි.

ව්‍යාජ මාර්ගගත ගිණුම් සහ සමයෝජිත ව්‍යාජ හැසිරීම් තමන්ගේ සේවාවන් හරහා සිදුවන බව අන්තර්ජාල අතරමැදි සේවා සපයන්නන් හොඳින් දනී. එහෙත්, ඔවුන් ඒවා සම්පූර්ණයෙන් තහනම් කිරීම සඳහා දැඩි ක්‍රියාමාර්ග නොගෙන ඇත්තේ බොහෝ විට ප්‍රකාශ කිරීමේ නිදහස හා පුද්ගල අනන්‍යතාවය ආරක්ෂා කිරීම සඳහාය.

එහෙත් එවැනි ගිණුම් මගින් ඔවුන්ගේ ප්‍රජා සම්මතයන් උල්ලංඝනය වේ නම් ඒවා අවලංගු කිරීමටද ඔවුන් පසුබට නොවේ. ව්‍යාජ ගිණුම් තහනම් කිරීමට කොමිසම කරන නියෝග ඔවුන් විසින් එලෙසම ක්‍රියාත්මක කරනු ඇතැයි සිතිය නොහැක. අවසාන වශයෙන් කිවයුතු වන්නේ මෙය මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාව ඇති කිරීමේ පුළුල් අරමුණින් හඳුන්වා දුන් පනතක් නොව, අන්තර්ජාලයේ ඇති අන්තර්ගතයන් පාලනය කිරීම සඳහාම යොදා ගැනීම අරමුණු කරගත් පනතක් බවයි. මෙමගින් ජනතාවගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට මෙන්ම රටේ ආර්ථිකයට හා සමාජ ක්‍රියාකාරීන්ට සිදුවන බලපෑම ඉදිරියේදී අපට අත්විදිය හැක.